# කෙටි නාට්‍ය අත් පිටපත
## වාසි කතෝති



**චරිත**

විදුහල්පතිතුමා - වයස අවු. 45ක පමණ කලිසම හා අත්දිග කමිසය, ටයි පටිය පැළඳ ඇත.

ව්‍යාපාරිකයා - වයස 35. ස්ථූලය. කලිසම හා කමිසය. රන් මාල පැළඳ ඇත. වටිනා ජංගම දුරකථනයක් භාවිතා කරයි.

රජයේ සේවකයා - අවු.35. කෘශය. සාමාන්‍ය කමිසය හා කලිස… අත කායබිාල බෑගයකි.

කාන්තාව - බ්ලවුසය හා කලිසම. රූමත් කාන්තාවකි. අවු. 25ක් පමණ වූ ජේත්‍රුකාරියකි.

කා.කා.ස. - කොසඟ අයෙකි. සරම හා කමිසය. අවු 60… ආසන්නය.

නිලධාරියා - අවු. 40ක් පමණ වූ කමිස කලිසම් ඇඳගෙ… තැනැත්තෙකි.

**ජවනිකා අංක 01**

විදුහල්පතිතුමාගේ නිල කාමරය. විශාල මේසය මත ෆයිල් කවර හා පොත්පත් තිබියකි. මේස ඔරලෝසුව, සීනුව හා පෑන් රඳවනයක් මෙන්ම දුරකථනයක් දක්නට ඇත. නිල පුටුවට අමතරව මේසය ඉදිරිපිට පුටු 3කි. පසෙක ලී අල්මාරියකි.

කා.කා.ස. විදුහල්පති මේසය අස්පස් කරයි. විදුහල්පතිතුමා පැමිණෙයි. සහායකයා ඔහුට වාඩිවීමට ඉඩකඩ සලසන්නේ ගෞරවයෙනි.

විදුහල්පතිතුමා

"මොකද ඔය එළියේ සද්දේ....."

විදුහල්පතිතුමා ටයි පටිය සකසමින් සහායකයා දෙස බලයි.

සහායකයා

"ඉන්ටවි එකෙන් ලකුණු අඩු වෙච්ච අය..... කොහොම හරි තමුන්ගේ ළමයා දා ගන්න සර් මුන ගැහෙන්න ඇවිත්...."

සහායකයා රහසින් මෙන් පවසයි. ඔහුගේ හැසිරීමෙන් පෙනෙන්නේ කිසියම් වාසියක් ඇති බවය. විදුහල්පතිතුමා ඉඟියෙන් විමසන්නේ තවරෙකු නැමිත ඇතිදැයි යන්නය.

සහායකයා

"හත් අට දෙනෙක්ම ඉන්නවා..... (ඇඟිල්ල ඔසවා විදුහල්පති-තුමා දන්නා අයෙකු සිටින බව හඟවමින්) කොන්ත්‍රාත් මහත්තයා ඇවිදින්....."

විදුහල්පතිතුමා

"ඇවිදින්.....හා..... හා..... එන්න කියනවා....."

විදුහල්පති ෆයිල් ගොනු වෙත අවධානය යොමු කරන්නේ තමුන්ට බැරෑරුම් වගකීම් රැසක් ඇති බව දනවමිනි. කා.කා.ස. වේදිකාව කෙළවරට යයි. මද වේලාවකින් කොන්ත්‍රාත්කරු පැමිණෙයි. විදුහල්පතිතුමා අසුනෙන් මදක් නැගී සිටියි.

විදුහල්පතිතුමා

"ලයිස්තුවේ දරුවාගේ නම නැතිද.....?"

විමතිය මුසු බැල්මකින් කොන්ත්‍රාත්කරුගෙන් විමසයි.

කොන්ත්‍රාත්කරු

"එකනේ..... සර් කියලත් බෝඩ් එකෙන් කැපිලා....."

විදුහල්පතිතුමා

"මොකද කරන්නේ..... මී..... මං බෝඩ් එකට කල්තියා කියා තිබ්බා..... කොහෙද මේ ඉන්ටවිව් පැනල් වල අය එන්න බැනේ....."

විදුහල්පතිතුමා මුහුණ බෙරි කරගනිමින් කාලයට පවසයි.

කොන්ත්‍රාත්කරු

"කොල්ලට මාක්ස් එකක් නැතිවෙයිද සර්....."

විදුහල්පතිතුමා තම උල්කරගෙන හිස සලන්නේ තත්වය අසීරු බව දැනවීමටය.

කොන්ත්‍රාත්කරු

"කීයක් ගියත් මට ප්‍රශ්නයක් නෑ..... මට කොහොමහරි මගේ ළමයා දාගන්න ඕනේ....."

විදුහල්පතිතුමා

"හරි..... හරි..... මං බෑ කිව්වේ නැනේ..... මංහෙමින් වචනේ දාලා බලන්නන්කෝ....." මිස්ටර් ධනරත්නට කීයක් විතර....?"

විදුහල්පතිතුමා ලතාවකට මෙන් පවසමින් කොන්ත්‍රාත්කරු දෙස බලයි. කොන්ත්‍රාත්කරු තම චෙක්පොත රැගෙන චෙක්පතක් ලියයි. විදුහල්පතිතුමා වටපිට බලයි.

කොන්ත්‍රාත්කරු

"මෙතන ලක්ෂ 5ක් තියෙනවා..... ඒක සර්ට..... පැනල් එකටත් ඕනනං සර් කියන්න..... කොලේජ් එකටත් උදවු කරන්න එපැයි....."

විදුහල්පතිතුමා චෙක්පත ගන්නේ වටපිට බලමිනි. ඔහු මහත් උද්දාමයට පත්ව ඇතිසේය.

<u>කොන්ත්‍රාත්කරු</u>

"එහෙනං සර්..... මට යන්න අවසරයි..... වැඩ හිරවෙල
මම නොගියොත් නැඩුයි....."

<u>විදුහල්පතිතුමා</u>

"ඒකනේ..... ඒකනේ..... මට කෝල් එකක් දුන්නම ඇතිනේ..... මං මිස්ටර් ධනරත්නගේ වැඩක් නොකර ඉන්නවයැ....."

විදුහල්පතිතුමාගේ බයාදු බැල්මකි. කොන්ත්‍රාත්කරු පිටවෙයි. විදුහල්පතිතුමා පුටුවේ වාඩිවෙයි. ඔහු ලක්‍ෂ 5 චෙක්පත දෙස බලන්නේ අනර්ඝ වස්තුවක් හිමිවූ ලෙසය. කා.කා. සහායක පැමිණෙයි. ඔහුගේ බැල්මද චෙක්පත වෙතය. විදුහල්පති ඔහු දෙස බලන්නේ රවාගෙනය.

<u>සහායකයා</u>

"ඊළඟ....."

උස්හඬින් පවසමින් ඔහු වේදිකාවෙන් පිටවෙයි. රජයේ සේවකයා කාමරයට පැමිණෙයි. විදුහල්පතිතුමා ඔහු දෙස බලයි.

<u>රජයේ සේවකයා</u>

"සර්..... සර් දන්නවනේ..... මගේ ගෙදර ඉඳන් ඉස්කෝලෙට මීටර් 100ක් නෑ..... අර ගේ පෙනෙන දුර..... පුදුමේ තියන්නේ මගේ ළමයා ඉස්කෝලෙට තේරිලා නෑ....."

විද්‍යාල්පතිතුමා

"තේරිලා නෑ..... එත්ද නාමලේඛන එහෙම අවුලක් තිබුණා ද.....?"

සුරතින් තම නිකට කසයි. රජයේ සේවකයාට වාඩිවීමට හෝ විද්‍යාල්පතිතුමා ආරාධනා නොකරයි.

රජයේ සේවකයා

"මොන..... මගේ තාත්තාගේ තාත්තාගේ කාලේ ඉඳන් ඉඩම තියෙන්නේ මගේ තාත්තාගේ නමට"....

විද්‍යාල්පතිතුමා

"ආන්න ප්‍රශ්නේ..... දැක්කද.....? ළමයාට ළකුණු අඩු වෙන්න හේතුව....."

රජයේ සේවකයා

"ඒක හරි අසාධාරණයිනේ සර්..... මම පවුලේ එකම දරුවා..... තාත්තාගේ නමට තිබ්බට කවදාහරි ඒ සේරම මටනේ....."

විද්‍යාල්පතිතුමා

"කතාව ඇත්ත..... හැබැයි ඉන්ටවිව් බෝඩ් එක බලන්නේ ලියුම් කියුම්..... මොනවා කරන්නද..... මගෙන් අත් බැඳලා..... මොනම හේතුවකටවත් මට බෑ බෝඩ් එකට බලපෑම් කරන්න..... මොකුවත් කළේත් නෑ..... ඉදිරියට කරන්නෙත් නෑ....."

රජයේ සේවකයා

"සර් අපේ පරම්පරාව ඉගෙන ගත්තේ මේ ඉස්කෝලේ....."

විදුහල්පතිතුමා

"බලමු..... බලමු..... කෝතටත් අභියාචනාවක් ඉදිරිපත් කරලා බලමුකෝ....."

විදුහල්පතිතුමා යළි තම කාර්යයෙහි නිරත වෙයි. රජයේ සේවකයා කා.කා.ස. දෙස බලන්නේ පිළිසරණක් අපේක්ෂාවෙනි.

කා.කා.ස.

"ඊළඟ....."

බ්ලවුසය හා කලිසම ඇඳි රූමත් කාන්තාව කාමරය තුළට පිවිසෙයි. ඇය තම අව් කන්නාඩිය ගලවා විදුහල්පතිතුමා දෙස බලයි. රජයේ සේවකයා පිටව යයි. ඇය දකිමෙන් විදුහල්පතිතුමා මහත් සතුටුව සුරතින් දක්වන්නේ ඇයට අසුන් ගන්නා ලෙසය.

කාන්තාව

"තැන්ක් යූ සර්....."

විදුහල්පතිතුමා

"මිස් ළඟනත ද.....?"

ඔහුගේ කැළිම මනමාලය.

කාන්තාව

"අපි ළඟදිය මෙහේ පදිංචියට ආවේ..... පන්සල ගාව අප්ස්ටෙයාර් එක රෙන්ට් කළා..... මගේ සන් කොහොමහරි කොලේජ් දාගන්න තමයි ට්‍රයි කළේ සර්....."

විදුහල්පතිතුමා වටපිට බලයි.

විදුහල්පතිතුමා

"දරුවගේ තාත්තා මේ ඉස්කෝලේ ආදි ශිෂ්‍යයෙක් -ද.....?"

ළමාවකට මෙන් විදුහල්පතිතුමා විමසන්නේ උදවු කිරීමට මාර්ගයක් සෙවීමේ අරමුණිනි.

කාන්තාව

"අනේ නෑ සර්..... එයා ඩවුන් සවුත්....."

විදුහල්පතිතුමා

"ම්..... එතකොට මිස්....."

කාන්තාව

"මං අප් කන්ට්‍රි..... මැරේජ් එකෙන් පස්සේ අපි සෙට්ල් වුනේ කලම්බු....."

ඇය සිනාසෙයි.

විදුහල්පතිතුමා

"ඩොනේෂන් එකක් එහෙම දෙන්න පුළුවන්නේ....."

කාන්තාව

"හබී ඇබ්‍රෝඩ් ගිහිං මාසයයිනේ සර්..... ලොකු ගානක් ස්පෙන්ඩ් කරන්න අමාරුයි....."

විදුහල්පතිතුමා හිස සොලවයි. කාන්තාවගේ දෑස රැඳී ඇත්තේ මේසය මතය.

විදුහල්පතිතුමා

"ඒත් මිස්ට උදව්වක් නොකර ඉන්නේ කොහොමද.....?"

විදුහල්පතිතුමා සෙමෙන් සෙමෙන් ඇයගේ අත අල්ලයි. ඇය ලැජ්ජාශීලී බවක් පෙන්නුවද අත ඉවතට නොගනියි. විදුහල්පතිතුමා ඇය වෙත නැඹුරු වී හිසවත් කොඳුරයි. ඇය ඊට එකඟතාවය පළ කරන්නේ ලැජ්ජාශීලීවය.

## ජවනිකා අංක 02.

වේදිකාව හෝටල් කාමරයක ස්වරූපයට සකසා ඇත. කාමරය මැද සයනයකි. පසෙකින් අල්මාරියක් බිත්තියේ කෙළවර දක්නට ඇත. කාන්තාව ඇඳේ වාඩිවී ඇත. ගවුමකින් සැරසී ඇත. විදුහල්පතිතුමා කාමරයට පිවිස ඇය අසලට පැමිණෙන්නේ ඉමහත් සතුටෙනි.

**විදුහල්පතිතුමා**

"කවුරුත් මොකුත් ඇහුවේ නැතේ....."

**කාන්තාව**

"සර්ගේ නම කිවුවම මේ රූම් එක පෙන්නුවා ..... සර් මගේ පුත්ගේ වැඩේ කොහොමද සර්....."

**විදුහල්පතිතුමා**

"ඔය කතා කරනවාද.....? ඒ සේරම හරි....."

විදුහල්පතිතුමා එසේ පවසනුයේ ඇය කරා සමීප වී උරහිසට අත තබමිනි. වහා ඇය අත ඉවත ලයි. විදුහල්පතිතුමා මවිත වෙයි. යළි ඇයගේ උරහිසට අත තබන්නට සැරසෙයි. එවර ඇය ඔහු තල්ලු කර නැගී සිටියි.

<u>විදුහල්පතිතුමා</u>

"විහිළු කරනවාද මට....."

ඇයට පිටුපසින් ඇති අල්මාරිය අසලින් රජයේ සේවකයා සහ තවත් අයෙක් සැඟවී සිටි තැනින් එළියට පැමිණෙයි.

<u>නිලධාරියා</u>

"මම අල්ලස් කොමිසමෙන්....."

නිලධාරියා තම හැඳුනුම්පත පෙන්වමින් පවසයි. විදුහල්පතිතුමා තැති ගනියි.

<u>විදුහල්පතිතුමා</u>

"අනේ සර්..... මං දරු පවුල්කාරයා.....
මෙන්න මෙයා තමයි මට එන්න කීවේ....."

විදුහල්පතිතුමා හඬා වැටෙමින් කාන්තාව පෙන්වයි.

<u>නිලධාරියා</u>

"ඔව්...., එයා අපේ කෙනෙක්..... එයාට මෙතෙන්ට එන්ට කියලා තමුන් කාමරේ ටුත් කරපු ලේඛනත් මං ගාව..... හැමදේම සල්ලි වලට..... අල්ලස් බලලගෙන කළාම මෙහෙම වෙනවා....."

Kumari.

---

(R.M.A.U. කුමාරි)
077-6729214/081-2376686